# සංස්කාරක පෙරවදන

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහයේ පස්වන වෙළුම මෙම වර්ෂයේ දී එළි දැක්වේ. විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ කුසලතා සහ ශාස්ත්‍රීය ලේඛන කුසලතා වර්ධනය කිරීමේ මූලික අරමුණ පෙරදැරිව ප්‍රකාශයට පත් කරන මෙම සඟරාව තුළ සමාජ සංඛ්‍යානය විශේෂවේදී හදාරන විද්‍යාර්ථයින්ගේ පර්යේෂණ ලිපි ඇතුළත් වේ. ඒ අනුව ඔවුන් විසින් සිදු කරන ලද පර්යේෂණයන් තුළින් ලබාගන්නා ලද නව දැනුම සහ සොයාගැනීම් මෙලෙස පර්යේෂණ ලිපි මඟින් ඉදිරිපත් කිරීම මෙම සඟරාව මඟින් සිදුවේ.

මෙම කටයුත්ත සඳහා මඟපෙන්වීම ලබා දුන් සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන ආචාර්ය මංජුල ගුණරත්න මහතාට මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමි. එමෙන් ම සඟරා ලිපි විමර්ශනය කරමින් මෙම සඟරාවේ සාර්ථකත්වයට දායකත්වය ලබා දුන් සියලුම මහාචාර්යවරුන්ට සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ට මාගේ ස්තුතිය පුද කරන අතර මෙම සඟරාව සඳහා පර්යේෂණ පත්‍රිකා ලබාදුන් සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ විද්‍යාර්ථීන්ට මාගේ සුභපැතුම් පළ කරමි.

පස්වන වරටත් එළි දක්වන මෙම ශාස්ත්‍රීය සංග්‍රහය ඉදිරියේදී ද සාර්ථකව ප්‍රකාශයට පත් කිරීමට සුභාශිංසන පිරිනමන අතර නන් අයුරින් සහයෝගය ලබා දුන් සැමට මාගේ කෘතඥතාවය පළ කරමි.

දිලූෂි කොඩිතුවක්කු

සහකාර කථිකාචාර්ය,

සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය,

කැලණිය විශ්වවිද්‍යාලය.